# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2012/13
(නව / පැරණි නිර්දේශය)
2015 දෙසැම්බර් - 2016 පෙබරවාරි

### සමාජීය විද්‍යා පීඨය

### සමාජ විද්‍යාව

### සමාජ විද්‍යාවේ මූලික සංකල්ප - SOCI E 1015

**ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

(තෝරාගත් ප්‍රශ්නවල සියලු අනු කොටස්වලට පිළිතුරු සපයන්න)

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

01. 1. සමාජ විද්‍යාව විෂය බිහිවීම සඳහා කාර්මික විප්ලවය හා ප්‍රංශ විප්ලවය කොතරම් වැදගත් කාර්යයක් ඉටු කරන ලද්දේ ද? (ලකුණු 10)

 11. සමාජ විද්‍යාව විෂය සංවර්ධනය සඳහා සම්භාව්‍ය සමාජ විද්‍යාඥයින් දෙදෙනෙකුගේ දායකත්වය සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 10)

02. 1. සමාජ විද්‍යාව විද්‍යාවක් ද? සාකච්ඡා කරන්න. (ලකුණු 08)

 11. සමාජ විද්‍යාව හා මානව විද්‍යාව අතර ඇති සබඳතාව උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 12)

03. 1. සමාජ සමූහයක් යනු කුමක්ද ? (ලකුණු 08)

 11. ප්‍රාථමික හා ද්විතීක සමූහ අතර පවත්නා වෙනස්කම් සන්සන්දනය කරන්න. (ලකුණු 12)

04. 'පවුලේ ප්‍රධාන කාර්යභාරය දරුවන් සමාජානුයෝජනය කිරීමයි' යන දැක්ම තක්සේරු කරන්න. (ලකුණු 20)

05. 'සමාජ ස්ථරායනය යනු සමාජයක පවත්නා අනිවාර්ය යාන්ත්‍රණයකි'. මෙම ප්‍රකාශය පිළිබඳ ඔබගේ අදහස දක්වන්න. (ලකුණු 20)

06. මැක්ස් වෙබර්ට අනුව නිලබල ක්‍රමයක පවත්නා ලක්ෂණ මොනවාද ? (ලකුණු 20)

07. සමකාලීන සමාජය තුළ සමාජ පාලන ක්‍රමයක් ලෙස ආගම ක්‍රියා කරන්නේ කුමන ආකාරයටද? (ලකුණු 20)

08. තෝරාගත් මාතෘකා <u>දෙකකට (02)</u> සමාජ විද්‍යාත්මක සටහන් ලියන්න.

 i. සමාජය හා ප්‍රජාව
 ii. තත්වය හා කාර්යභාරය
 iii. සමාජ ක්‍රියා
 iv. අධ්‍යාපන සංස්ථාව

(ලකුණු 10×2=20)